**2026.03.10 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 මාර්තු මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගිත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
11. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
13. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
14. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
15. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
16. එච්. තිලක් උපුල් වමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
17. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
18. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
19. බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
20. ඉදුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

සහභාගී නොවූ :-

1. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී
2. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා, ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. තිලක් උපුල් වමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි

මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා හා ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා යන මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

**ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරු, ප්‍රාදේශීය සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**1. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම :-**

1.1. 2026.02.10 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

2026.02.10 දින පැවති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව ඔබතුමන්ලා වෙත මේ වන විට යොමු කර ඇති බවත්, එහි සංශෝධන තිබේ නම් ඒවාට යටත්ව වාර්තාව කියවූවා සේ සලකා සභාව මඟින් සම්මත කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

**සංශෝධන අංක 01 - ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරන සංශෝධන**

පිටු අංක 13 හි 5.7.2 මාගේ යෝජනාව මා විසින්ම ස්ථිර කළ ලෙස දක්වා ඇති අතර එය “ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී” ලෙස සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

**සංශෝධන අංක 02 - ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරන සංශෝධන**

65 පිටුවේ වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීමේ දී “එතුමියගේ නවසට යන කන්දෙමුල්ල මාර්ගයට ඒ අසල නිවසක වතුර තාප්පය දිගේ ගලාගෙන විත් පාරට වැටෙන බවත්” යන්න “එතුමියගේ නවසට යන කන්දෙමුල්ල මාර්ගයට ඒ අසල නිවසක වතුර තාප්පය යටින් ගලාගෙන විත් පාරට වැටෙන බවත්” ලෙස සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

2026.02.10 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

1.2. 2026.02.20 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

2026.02.20 දින පැවති විශේෂ සභා රැස්වීමේ වාර්තාව ද ඔබතුමන්ලා වෙත මේ වන විට යොමු කර ඇති බවත්, එහි ද සංශෝධන තිබේ නම් ඒවාට යටත්ව වාර්තාව කියවූවා සේ සලකා සභාව මඟින් සම්මත කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

සංශෝධන ඉදිරිපත් නොවූ බැවින් 2026.02.20 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථීරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.35 ට ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා හා ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**2. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන :-**

2.1. අංක SPLG/GL/B/PA/2025/3-vi හා 2026.02.27 දිනැති ලිපිය මඟින් වරිපනම් බදු, වෙළඳ බලපත්‍ර, කර්මාන්ත/ ව්‍යාපාර බදු, උසාවි දඩ, මුද්දර ගාස්තු, සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්වල ආදායම හා දැන්වීම් පුවරු ආදායම සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද විගණන විමසුමක් ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-**

3.1. දෙද්දුව පන්සල අතුරු පාර කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් එම ප්‍රදේශවාසීන් විසින් ගරු සභාපතිතුමා, පෙර ලේකම්තුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත ස්තූතිය පුදකරමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-** කිසිවක් නැත

**5. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**5.1. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-</u>**

5.1.1. කාර්ය මණ්ඩලයේ විශ්‍රාම වැටුප් සකස් කිරීම ඇතුළු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාළ සේවා ලබා ගැනීමේ දී මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදුකළ යුතුව ඇත. එහි දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මධ්‍යගත තොරතුරු පද්ධතියට පහසුවෙන් පිවිසීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලබා ගත් LGN (Local Government Network) පහසුකමක් තිබිය යුතු වේ. එබැවින් ප්‍රාදේශීය සභාවට LGN පහසුකම ලබා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.2. 2026.02.09 වන දින සිට මුද්දර ගාස්තු ඉහළ යාම හේතුවෙන් සභාවේ මුද්දර යන්ත්‍රය සඳහා දැනට වරකට අනුමත කර ඇති මුද්දර පහසුකම රු. 20,000/- සිට රු. 30,000/- දක්වා වැඩි කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

මුද්දර ගාස්තු ඉහළ යාම හේතුවෙන් පෙර පැවති රු. 20,000/- ක මුදල ප්‍රමාණවත් නොවන බවත්, මේ පිළිබඳ කරුණු විමසීමේ දී නැවත මුද්දර යන්ත්‍රය සකස් කළ හැක්කේ රු. 50,000/- මුදලට පමණක් බවත් එම නිසා මෙම යෝජනාව සංශෝධනය කිරීමට සිදු වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම.</u>**

2026.02.09 වන දින සිට මුද්දර ගාස්තු ඉහළ යාම හේතුවෙන් සභාවේ මුද්දර යන්ත්‍රය සඳහා දැනට වරකට අනුමත කර ඇති මුද්දර පහසුකම රු. 20,000/- සිට රු. 50,000/- දක්වා වැඩි කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම සංශෝධිත යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.3. 2026.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කරන ලද කෝම්මල ග්‍රාම නිලධාරී වසමේ පදිංචි ආබාධිත වයෝවෘද්ධ පවුලක් වන එස්. එල්. සෝමවතී මියගේ පවුල සඳහා රුපියල් 50,000/- ක වියදමට යටත්ව ජල සම්පාදන අවශ්‍යතා සපුරාලීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**

ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අයදුම්පත් භාර දී මාස 02 ක් පමණ වන බවත්, ජල සම්පාදන මණ්ඩලය වෙතින් දුරකතනයෙන් විමසූ විට මේ වන විට ජලය ලබා දීමේ කටයුතු නවතා ඇති බවත්, නැවත අප්‍රේල් මාසයෙන් පසුව ජලය ලබා දීමේ කටයුතු ආරම්භ කරන බවට ප්‍රකාශ කළ බවත්, නමුත් එම අහිංසක මිනිසුන් හට සිංහල අලුත් අවුරුද්ද සැමරීම සඳහා මෙය විශේෂ කටයුත්තක් සේ සලකා අලුත් අවුරුද්දට පෙර එම කටයුතු සලසා දෙන ලෙසට සභාව මඟින් නැවත ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බවටත් මෙහි දී සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

මෙය පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් නොවන බවත්, නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කර එහි දී නිර්ණායක කීපයක් ඔස්සේ සලකා බලා ඒ හරහා නිර්දේශ වූවක් වන බවත්, මෙම අහිංසක පවුල වෙනුවෙන් අලුත් අවුරුද්දට පෙර ජල පහසුකම් ලබා දීමට නැවත ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.4. 2026.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කරන ලද කුඩා ඌරගහ පෙර පාසල සඳහා අයි. ඩී. ප්‍රේමරත්න මහතා විසින් පරිත්‍යාග කරන ලද පර්චස් 28 ක භූමි ප්‍රමාණයේ පෙර පාසල සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තිලක් උපුල් චමින්ද මැතිතුමා</u>

එම භූමි ප්‍රමාණයෙන් 50% ක පමණ තිබෙන්නේ පස් පුරවා සංවර්ධනය කළ යුතු කොටසක් බවත්, ඒ නිසා සභාවේ තාක්ෂණ සේවා නිලධාරීන් මඟින් එම ස්ථානය පරීක්ෂා කරවා එම භූමිය ප්‍රතිසංස්කරණය කර ඉන්පසු එහි ඉදි කිරීම් කටයුතු සිදු කිරීම සුදුසු වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මේ අවුරුද්ද ඇතුළත සභා අරමුදල් හැර පෙර පාසල් වෙනුවෙන් වෙනත් යම් මුදලක් වෙන් වුවොත් ඒ මුදල්වලින් මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා සභාව මඟින් යෝජනාවක් සම්මත වී තිබිය යුතු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, තිලක් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට සභාවේ ශ්‍රම දායකත්වය මඟින් මෙම භූමිය සකස් කිරීම සිදු කළ යුතු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.5. 2026.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කරන ලද පහත නිර්ණායක එකක් හෝ කීපයක් ඔස්සේ බෙන්තොට බල ප්‍රදේශයේ ස්ථිරව පදිංචිව සිටින වැසිකිළි නොමැති පවුල් ඒකක 10 ක් සඳහා එක් පවුල් ඒකකයකට රුපියල් 50,000/- ක් වන සේ පවුල් ඒකක 10 සඳහා රුපියල් 500,000/- ක ඇස්තමේන්තුගත මුදලට මූල්‍යාධාර හෝ ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

1). අඩු ආදායම්ලාභියෙකු වීම
2). එක්තැන් වැඩිහිටියෙකු/ කීප දෙනෙකු සහිත පවුලක් වීම
3). පාසල් සිසුන් සහිත පවුලක් වීම
4). ගැහැණු දරුවන් සහිත පවුලක් වීම.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම නිර්ණායක 04 ම අවශ්‍ය නොවන බවත්, නමුත් නිර්ණායක ගණන වැඩි වන විට එම පවුලට ලැබෙන මූලිකත්වය වැඩිවන බවත්, මීට අමතරව එක් කිරීමට සුදුසු වෙනත් නිර්ණායක තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

කාන්තා මූලික පවුලක් වීම යන නිර්ණායකයත් එක් කිරීම සුදුසු බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
එම නිර්ණායකයත් එක් කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම.</u>
පහත නිර්ණායක එකක් හෝ කීපයක් ඔස්සේ බෙන්තොට බල ප්‍රදේශයේ ස්ථිරව පදිංචිව සිටින වැසිකිළි නොමැති පවුල් ඒකක 10 ක් සඳහා එක් පවුල් ඒකකයකට රුපියල් 50,000/- ක් වන සේ පවුල් ඒකක 10 සඳහා රුපියල් 500,000/- ක ඇස්තමේන්තුගත මුදලට මූල්‍යාධාර හෝ ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

1). අඩු ආදායම්ලාභියෙකු වීම
2). එක්තැන් වැඩිහිටියෙකු/ කීප දෙනෙකු සහිත පවුලක් වීම
3). පාසල් සිසුන් සහිත පවුලක් වීම
4). ගැහැණු දරුවන් සහිත පවුලක් වීම.
5). කාන්තා මූලික පවුලක් වීම.

එම සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.6. 2026.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කළ පරිදි කුඩා ඌරගහ පෙර පාසල ඉදි කිරීමට නියමිත නව භූමියේ කුඩා ඌරගහ පුස්තකාල ගොඩනැගිල්ල ද ඉදි කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
කුඩා ඌරගහ පෙර පාසල හා පුස්තකාලය යන දෙකම ක්ෂේත්‍රාරාම විහාරස්ථානයේ අපහසුතා මධ්‍යයේ පවත්වාගෙන යන බවත්, පෙර පාසල නව භූමියේ ඉදි කිරීමේ දී පුස්තකාලය සඳහා ද කොටසක් වෙන් කර ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මත අදියර කීපයක් යටතේ හෝ පුස්තකාලය ද ඉදි කිරීම සුදුසු බවත්, බෙන්තර, ඉදුරුව, හබුරුගල හා ගෝනගල සඳහා වෙන වෙනම පුස්තකාල පවතින බවත්, ඌරගහ ප්‍රදේශය විශාල ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක් වන බැවින් ඔවුනගේ පහසුව සඳහා ඌරගහට ද වෙනම පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.7. 2026.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කළ පරිදි ගැබිණි මව්වරුන් සඳහා නැළවිලි ගීත වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් වන රු. 163,000/- ක දළ වියදම් ඇස්තමේන්තුගත මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
මේ යෝජනාව සම්බන්ධව මන්ත්‍රීවරුන්ගෙන් වෙනත් ඉල්ලීමක් ඉදිරිපත් වූ බවත්, ගැබිනි මවුවරුන්ට දරු ප්‍රසූතියට පෙර සකස් කර ගත යුතු ද්‍රව්‍ය ලැයිස්තුව සඳහා විශාල මුදලක් වැය වන බැවින් වර්තමාන ආර්ථික තත්ත්වය සමඟ එම අවශ්‍යතා සපුරා ගැනීමට අපහසු බල ප්‍රදේශයේ පවුල් කීපයක් සඳහා මෙම මුදලින් යම් කොටසක් වෙන්කර හෝ මෙම සම්පූර්ණ මුදලම වෙනත් ව්‍යාපෘති යෝජනාවක් ලෙස සලකා හෝ එම ද්‍රව්‍ය ලැයිස්තු ලබා දීම සුදුසු වන බවත්, ලෙනිකා මන්ත්‍රීතුමිය පෞද්ගලිකව මේ සඳහා යම් දායකත්වයක් ලබා දීමට කැමැත්ත පලකළ බවත්, නිර්ණායක කීපයක් ඔස්සේ සලකා බලා මෙම පවුල් ඒකක හඳුනා ගැනීම සුදුසු බවත්, මෙම වෙන්කරන ලද මුදල් ප්‍රමාණය මත හෝ යම් ප්‍රමාණයක් වැඩි කර හෝ ඒසේත් නැතිනම් සම්පත්දායකයින් සම්බන්ධ කරගනිමින් හෝ මෙය සිදු කිරීම සුදුසු බවත්, මේ සම්බන්ධව ඉදිරි නිවාස හා ප්‍රජා කමිටු රැස්වීමක දී ස්ථිර තීරණයක් ලබා ගන්නා තෙක් මෙම යෝජනාව ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමුකර වැය අනුමැතිය ලබා ගැනීම සුදුසු වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

__ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා__
නිර්ණායක කීපයක්ම තිබෙන පවුල් සඳහා මූලිකත්වය දීම සුදුසු බව මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.8. 2026.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කරන ලද 2026 බෙන්තොට ප්‍රාදේශීය සභා පෙර පාසල් සිහිති අවුරුදු උත්සවය සඳහා වන රු. 162,500/- ක දළ වියදම් ඇස්තමේන්තුගත මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
මෙය සාම්ප්‍රදායික ලෙස සෑම වර්ෂයකම පවත්වන උත්සවයක් වන බවත්, මෙම වර්ෂයේ සමහර පෙර පාසල්වල ළමුන් ඉතා සීමිත ප්‍රමාණයක් සිටින බැවින් පෙර පාසල් සියල්ලම එකතු කර එක් උත්සවයක් පවත්වා ළමුන්ට තෑගි ලබා දීම සිදු කරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.9. දකුණු පළාත් පාලන සංවර්ධන සැලැස්ම - 2026, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - පළාත් පාලන වෙනත් සේවා අංශය යටතේ අනුමත රුපියල් මිලියන 7 ක ප්‍රතිපාදන මුදලින් බෙන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාර භූමියේ අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම යෝජනාව සම්බන්ධීකරණ කමිටුවට යොමු කර අනුමැතියට යවා ඇති බවත්, මේ අවුරුද්දේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ ලක්ෂ 70 ක වැඩිම මුදලක් ලැබෙන්නේ මෙම පාලර් එක ඉදි කිරීම වෙනුවෙන් වන බවත්, එම මුදලින් හැකි ප්‍රමාණයක් සාදා නිම කර ඉතිරි කොටස් සභා අරමුදල් මඟින් හෝ වෙනත් ලැබෙන ප්‍රතිපාදන මඟින් හෝ ඉදිරි වර්ෂයේ සාදා නිම කිරීමට බලාපොරොත්තු වන බවත්, ලේකම්තුමා හා තාක්ෂණ සේවා නිලධාරීන් සමඟ එවැනි ස්ථාන නිරීක්ෂණය කිරීමට ගිය බවත්, ඉදිරි අනාගතය ගැන සිතා මහල් 02 කට මෙම ඉදි කිරීම සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, ඉදිරියේදීත් තවත් ස්ථාන පරීක්ෂා කිරීමට යාමට බලාපොරොත්තු වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.10. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2026, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ප්‍රජා ජල සම්පාදන අංශය යටතේ අනුමත රුපියල් මිලියන 2 ක ප්‍රතිපාදන මුදලින් ගලගම ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජා ජල ව්‍යාපෘතිය සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>

මෙම ප්‍රජා ජල යෝජනා ක්‍රමය යටතේ ගලගම ගල්පොත්ත මාර්ගයේ පොදු ළිඳක් තෝරා ගෙන කඳු සහිත ප්‍රදේශයට ජල නළ පද්ධති ලබා දීමට කටයුතු කරන බවත්, එම ස්ථානයේ නෑමට සහ බීමට වෙන වෙනම ළිඳවල් 02 ක් පවතින බවත්, නමුත් බීමට යොදා ගන්නා ළිඳ කුඩා බැවින් දිය නෑමට සහ බීමට පවතින ළිඳවල් එක් කොට එම ජල පහසුකම් ලබා ගැනීම සුදුසු බවත්, මේ සඳහා මිලියන 02 ක මුදලක් වෙන් වී ඇති බැවින් ගම්වාසීන් සමඟ ද සාකච්ඡා කොට ගලගම ප්‍රධාන මාර්ගයේ පුංචිවෙල්ල දක්වා ලබා දී ඇති ජල නළ පද්ධතිය ඉන් ඉදිරියට හැකිතාක් දුරකට ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල් ජල නළ දිගු කිරීමට ලබා නොදිමට ඉඩ ඇති බවත්, පසුගිය වසරේදීත් පළාත් පාලනය තුළ ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල් ඉතිරි වී තිබූ බවත්, ඊට හේතු ලෙස යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගිකව එම භූමිවල ඉඩකඩ නොමැති වීමත්, ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ ගැටලුත්, යෝජිත ස්ථානවල එම ව්‍යාපෘති ඉදි නොකිරීමත් දැක්විය හැකි බවත්, එම ඉතිරි වී තිබූ මුදල් යොදාගෙන පසුගිය වසර අවසාන වීමට පෙර මාස 1 ½ ක වගේ කාලයක් ඇතුළත සිල්වර්ගාඩ්න් ඉඩමේ ජල ව්‍යාපෘතියක් ආරම්භ කර අංගසම්පූර්ණව සකස් කර අවසන් කළ බවත්, එහි ජලය ලබා දීමේ කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට පවතින බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා</u>

ජල ව්‍යාපෘතියේ ස්ථානය එසේ නැතිනම් ජලය සපයාගන්නා ස්ථානය පිළිබඳ නිරීක්ෂණය කොට ප්‍රදේශයේ ජනතාව මේ සම්බන්ධයෙන් සිදු කරනු ලබන ඉල්ලීම ද සලකා බලා, ගලගම ප්‍රදේශයේ මුළු ග්‍රාම සේවා වසමටම ප්‍රජා ජල සැපයුම හෝ මාර්ගස්ථ ජල සැපයුම නොමැති බැවින් ඒ පිළිබඳ ශක්‍යතාව පරීක්ෂා කර බලා ජල සැපයුම ලබා දීම සුදුසු බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සභා අරමුදල් මඟින් සිදු කිරීමට නිර්දේශය ලැබීම සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බවත්, එසේ කිරීමට හැකි වුවහොත් සමිති සම්බන්ධ කර ගැනීමට වෙහෙසීමට අවශ්‍ය නොවන බවත්, සියලු දෙනාට ජලය ලබා දීමට හැකියාවක් ඇත්නම් ඒ සඳහා සභාවක් විදියට යෝජනාවක් ඉදිරිපත් කර හෝ උත්සහ කර බැලීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.11. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2026, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ප්‍රජා ජල සම්පාදන අංශය යටතේ අනුමත රුපියල් මිලියන 2 ක ප්‍රතිපාදන මුදලින් උඩුමුල්ල මානාන ප්‍රජා ජල ව්‍යාපෘතිය සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>
මේ සඳහා ඉඩමක් සොයා බැලූ බවත්, එම අවස්ථාවේ දී නිශාන්ත නැමති මහත්මයෙක් වතුර ටැංකිය හා මෝටරය තැබීමට තම ගෙවත්තේ කොටසක් ලබා දීමට කැමැත්ත පල කළ බවත්, නමුත් එම මහතාගේ නිවස පිහිටා ඇත්තේ කන්දක් වැනි කොටසක බැවින් එතරම් ඉහළකින් ජලය ලබා ගැනීම දුෂ්කර වන බවත්, ඒ හේතුවෙන් වෙල් මට්ටමින් ඉඩමක් සොයා බැලූ බවත්, එහි දී සභාවට අයිති අක්කර 1 ½ ක පමණ සුසාන භූමියක කොටසක් මේ සඳහා යොදා ගැනීමට හැකියාව ඇති බව පෙනී ගිය බවත් මෙහි දී සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 10.10 ට ගරු මන්ත්‍රී බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සුසාන භූමිය සහිත ඉඩමින් කොටසක් ලබා දීමේ දී ගැටලු කීපයක් මතුවන බවත්, ළිඳ පහළ ස්ථානයක ඉදි කර නමුත් ඒ ආසන්නයෙන් නිවාස නොමැති නම් ජලය ලබා ගැනීමට ජනතාව නොමැති නම් එම ස්ථානයේ ඉදි කිරීමෙන් ප්‍රයෝජනයක් නොමැති වන බවත්, සුසාන භූමියක කොටසක් වන නිසා එහි මිනී වළලන, පුච්චන නිසා අවශ්‍ය දුර ප්‍රමාණයක් තබා ළිඳ සකස් කළ යුතු බවත්, එම ළිඳේ ජලය බීමට සුදුසු විය යුතු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා</u>
කන්ද මුදුනෙම සිටින ජනතාවට වැඩිපුරම ජල ප්‍රශ්නය තිබෙන නිසා එම ස්ථානයේ ඉදි කිරීම සුදුසු බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
එම ස්ථානය ළිඳ සකස් කිරීමට භාරලා අවසානයේ ජලය නොමැති වුණොත් එහි ද ගැටලුවක් මතුවන බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා**</u>
ජල සම්පාදන මණ්ඩලය මගින් එම ස්ථානය පරීක්ෂා කරවා ඉන්පසු කටයුතු ආරම්භ කිරීම සුදුසු බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධ මැතිතුමා**</u>
ඒ සඳහා තරමක් විශාල මුදලක් එම ආයතනයට ගෙවීමට සිදුවන බව සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය**</u>
නළ ළිඳක් මගින් ජලය පොම්ප කිරීමේ හැකියාව ද පවතින බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.12. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2026, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ප්‍රජා ජල සම්පාදන අංශය යටතේ අනුමත රුපියල් මිලියන 2 ක ප්‍රතිපාදන මුදලින් දෙද්දූව මහගෙදරවත්ත ප්‍රජා ජල ව්‍යාපෘතිය සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා**</u>
දෙද්දූව මහගෙදරවත්ත ප්‍රදේශයේ ළිං 3,4 ක් ම පවතින නමුත් ඒවායේ ජලය බීමට ගත නොහැකි බවත්, පසුගිය කාලයේ එම ප්‍රදේශයේ කැඩී තිබූ නළ ළිඳක් අලුත්වැඩියා කිරීමට බලාපොරොත්තු වූ බවත්, ඊට ප්‍රථම එහි ජලය බීමට සුදුසු ද යන වග PHI ලවා පරීක්ෂා කරගත යුතු බවත්, එම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු බිම් තීරුවක් පවතින බවත්, එම කොටසේ ජලය බීමට ලබා ගත හැකි මට්ටමේ පවතින බවත්, එම ප්‍රදේශයේ සභාව සතු ඉඩම් බොහෝ ප්‍රමාණයක් තිබෙන බැවින් ළිඳ කැපීමට පමණක් ප්‍රමාණවත් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු භූමි කොටසින් සභාවට පවරා ගැනීමට හැකිවන්නේ නම් එය වඩා සුදුසු වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
දැනට ළිඳක් සකස් කර ලබා දී තිබෙන බවට මෙහි දී ගරු මන්ත්‍රීතුමාගෙන් විමසන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා**</u>
දැනට ළිඳක් ලබා දී ඇති බවත්, දැනට පවුල් 18 ක් එමඟින් ජලය පොම්ප කර ලබා ගන්නා බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.13. ගෝනගල පොදු වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ පුස්තකාලය සහිත පළමු මහලේ වැඩ අවසන් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

මේ සඳහා සභාවේ අරමුදල් වියදම් කළා වුණත් බිම් මහළ බදු දීම මඟින් එක් කෝටි තිස් ලක්ෂයකට ආසන්න මුදලක් මේ වන විට ඒ හරහා ලැබී ඇති බවත්, වාර්ෂිකව ලක්ෂ 12 කට ආසන්න මුදලක් මේ මඟින් ලැබෙන නිසා පළමු මහලේ ඉතිරි වැඩ සඳහා වියදම් කරන මුදල ඊළඟ මාසයේම නැවත ලැබෙන නිසා වරිපනම් වැනි සභාවට ලැබෙන වෙනත් ආදායම් මේ සඳහා යොදා ගැනීමට අවශ්‍යතාවයක් නොමැති වන බවත්, පසුගිය දිනක zoom තාක්ෂණය ඔස්සේ පළාත් පාලන කොමසාරිස්තුමිය සමඟ පැවති සාකච්ඡාවකට ලේකම්තුමා සමඟ සම්බන්ධ වූ බවත්, එහිදී ද මේ සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස යෝජනා කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.2. ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

5.2.1. වරාහේන ග්‍රාම නිලධාරී වසමේ සූරියගොඩ බෝ සමිඳු පාරේ නිවාස 07 ක් සඳහා යාමට පස් දමා තලා ඇති පළල අඩි 10 ක් පමණ හා දිග මීටර් 70 ක් පමණ වන තඹවිට වත්ත පාර කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.2. වරාහේන ග්‍රාම නිලධාරී වසමේ නීලිස්ගෙවත්ත පංසල පාරේ ඉදිරිපිටට වන්නට ඇති පවුල් 08 ක් පදිංචි වී සිටින පස් දමා සකස් කර ඇති පළල අඩි 08 ක් පමණ වන ළමානාරච්චි වත්ත පාර කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.3. ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට, ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ හා ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න යන සභිකවරු විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධිත යෝජනාව.**

5.3.1. ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය අනුව බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් ස්ථානයක් හෝටලයක, ආපනශාලාවක හෝ නවාතැන්පොලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ

නවාතැන්පොල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද අවස්ථාවක, ඒ සඳහා බලපත්‍ර ලබා දීමේ දී අදාළ වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ ඒ ආපනශාලාව, හෝටලය හෝ නවාතැන්පොලේ සම්පූර්ණ ආදායමින් සියයට දශම දෙකයි පහක (0.25%) බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අය කිරීමටත්, එකී බලපත්‍ර ගාස්තු නියම කිරීම සඳහා, වරලත් ගණකාධිකාරීවරයකු විසින් විගණිත අදාළ ආයතනයේ, 2025/2026 අවසන් වර්ෂයේ අවසාන ගිණුම් ප්‍රකාශය අයිතිකරු, කළමනාකරු හෝ වෙනත් බලයලත් අයකු විසින් සහතික කොට වර්ෂයක් පාසා බෙන්තොට ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙය තීරණාත්මක මෙන්ම නීතිමය කාරණාවලට හා විවිධ අර්ථකථනවලට ලක් වීමට ඉඩ ඇති යෝජනාවක් වන බවත්, සභාවේ සභාපතිවරයා ලෙස සභාවට ලැබිය යුතු එක රුපියලක් හෝ වේ නම් එය ලබා ගැනීමට උත්සහ කරන බවත්, මෙම සංචාරක හෝටල්වල කළමනාකරුවන් හෝ අයිතිකරුවන් සමග කිසිදු පුද්ගලික සබඳතාවයක් නොමැති බවත්, ඉතාමත් සද්භාවයෙන් යුතුව මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, පළාත් පාලන ආයතන, කොමසාරිස්තුමා ඇතුළු සියලු දෙනා බෙන්තර සලකනු ලබන්නේ සංචාරක හෝටල් බහුල නිසා ඉතා හොඳ ආදායමක් උත්පාදනය කරන ගන්නා සභාවක් ලෙසට වන බවත්, නමුත් බෙන්තර ප්‍රාදේශීය සභාව තඹ දොයිතුවක ආදායමක් නොමැති සභාවක් වන බවත්, මෙමෙ සංචාරක හෝටල්වලින් කුණු එකතු කිරීමත් සභාවට පාඩුවක් වන බවත්, ට්‍රැක්ටරයක් සඳහා රු. 1,500/- ක මුදලක් ලබා දෙන නමුත් කුණු එකතු කිරීමට යාම සඳහා සේවකයින් 04 දෙනෙකු පමණ යෙදවීමට සිදු වන බවත්, ට්‍රැක්ටරයට අවශ්‍ය ඉන්ධන ලබා ගත යුතු බවත්, එම රැගෙන එන කුණු වෙන් කිරීම සඳහා තවත් පිරිසක් යොදවා ඇති බවත්, ඉතිරි වන පොලිතින් රත්ගම මොන්රෝවියාවත්ත කසල අංගනයට රැගෙන යාමට නැවත ඉන්ධන අවශ්‍ය වන බවත්, රත්ගමට කුණු ලබා දෙනවාට වරකට රු. 7,500/- ක මුදලක් ගෙවිය යුතු බවත්, මේ සියල්ල සලකා බැලීමේ දී කුණු එකතු නොකර සිටීම සභාවට ලාභදායී වන බවත්, මෙම යෝජනාව සම්බන්ධව පසුගිය විගණන කමිටුව අවස්ථාවේ දී පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය හා විගණන අධිකාරී සමඟ දීර්ඝව සාකච්ඡා කළ බවත්, මීට අමතරව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය හරහා අවශ්‍ය නීති උපදෙස් ලබා ගත් බවත්, කිසිදු අවස්ථාවක නඩුව ඉල්ලා අස්කර නොගන්නා බවත්, සභාවට මෙම නඩු සඳහා වෙන් කළ හැකි මුදල් ප්‍රමාණය ඉතා සීමිත බවත්, නමුත් හෝටල් සංගමය වරකට රු. 150,000/- ක පමණ මුදලක් වියදම් කොට ජනාධිපති නීතිඥවරු ලබා ගන්නා බවත්, 2018 වර්ෂයේ සිට මෙම නඩු කටයුතු සිදු කරන බවත්, නඩුව සභාව දිණුවොත් 1% ක් සභාවට ලැබෙන බවත්, පැරදුණොත් කිසිම මුදලක් නොලැබෙන බවත්, නඩුව දිනීමට ඇති හැකියාව ඉතාමත්ම අල්ප වන බවත්, නමුත් මේ හරහා 0.25% ක ප්‍රමාණය ලබා ගැනීමට හැකි වන බවත්, මේ වර්ෂයේ දෙසැම්බර් වන විට දැනට ලැබෙන ප්‍රමාණය මෙන් තුන් ගුණයක පමණ ආදායමක් ලබා ගත හැකි බවට විශ්වාස කරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, රංජිත් ප්‍රනාන්දු මැතිතුමා</u>

“මෙහි නීත්‍යානුකූලභාවය පිළිබඳ පළාත් පාලනයෙන් විමසීමක් කළා ද?. එහි නිර්දේශය බලන්න පුළුවන් ද?” ලෙස මෙහි දී ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

පසුගිය විගණන කමිටුවේ දී මේ පිළිබඳ පෞද්ගලිකවම විගණන අධිකාරී හා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය මඟින් විමසීම් කළ බවත්, එහි දී මේ වන විට ලැබෙන මුදලට වඩා මෙම යෝජනාව මඟින් ලැබෙන මුදල අඩු වුණොත් පමණක් ගැටලුවක් වන බවට සඳහන් කළ බවත්, 0.01% සිට 1% දක්වා මෙම ප්‍රතිශතය තීන්දු කිරීමේ අයිතිය සභාව සතු වන බවත්, අවුරුදු 08 ක කාලයක පටන් නඩු පැවරුවත් ඒ සෑම නඩුවක්ම සභාව පරාද වූ බවත්, අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් රජයේ නීතිපති පෙනී සිටියත් පළාත් පාලන ආයතන වෙනුවෙන් පෙනී නොසිටින බවත්, මෙම යෝජනාව හරහා දැනට ලැබෙන මුදල මෙන් තුන් ගුණයක් පමණ ලබා ගැනීමට හැකිවන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

20218 සිට 2021 දක්වා 1% බැගින් නොගෙවූ හෝටල් සඳහා මෙම නඩු පැවරීම් කටයුතු සිදු කර ඇති බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා</u>

මේ නිසා අපිට අහිමි වන මුදල් ප්‍රමාණය කොපමණදැයි ගරු මන්ත්‍රීතුමා විසින් මෙහි දී විමසන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ලක්ෂ 30 ක පමණ මුදලක් අහිමි වන බවත්, නමුත් තරු පන්තියේ හෝටල් මඟින් 0.25% ප්‍රතිශතයට අය කර ගැනීමේ දී ලක්ෂ 150 ක පමණ මුදලක් අය කර ගැනීමට හැකිවන බවත්, ඒ අනුව ලක්ෂ 120 ක පමණ ආදායමක් ලබා ගැනීමට හැකිවන බවත්, මෙහි දී බල ප්‍රදේශයේ අනෙකුත් කුඩා හෝටල් හතළිස් ගණනකින් පමණ ද අඩු ප්‍රතිශතයෙන් අය කර ගැනීම නිසා බල ප්‍රදේශයේ ජනතාවට සහනයක් සැලසීමට හැකියාව ලැබෙන බවත්, මෙම නඩු හේතුවෙන් තරු පන්තියේ හෝටල් සභාව සමඟ සුහදත්වයකින් තොර වන බවත්, මේ හරහා නැවත සුහදත්වය වර්ධනය කර ගැනීමට ද අවස්ථාවක් ලැබෙන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.4. <u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.4.1. මැදගොඩවත්ත, අකාඩේගොඩ පෙදෙසේ මැදගොඩවත්ත පාරෙහි අඩි 45 ක පමණ කොටස කොන්ක්‍රීට් කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.2. "උඩුමුල්ල මානාන" ජල ව්‍යාපෘතිය උඩුමුල්ල - මානාන සුසාන භූමියේ පහළ කොටසේ සිදු කිරීමට අවසර ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මෙය සුසාන භූමියක් බැවින් ඉහත 5.1.11 යෝජනාවේ දී සාකච්ඡා කළ පරිදි ස්ථානය සුදුසුදැයි බලා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.5. <u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.5.1. හබුරුගල සූරියගම ග්‍රාම නිලධාරී වසමේ සූරියගම මාතෘ සායනයට හා ගම්මානයට පිවිසෙන මාර්ගයේ මීටර් 38 ක පමණ ප්‍රමාණය සභාවේ සේවකයින් යොදවා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
මෙම මාර්ගය නිවාස 40 කට වැඩි ප්‍රමාණයකට ගමන් කරන මාර්ගයක් වන බවත්, හබුරුගල සූරියගම ප්‍රදේශයේ සියලුම මාතෘ සායන සඳහා මව්වරුන් ගමන් කරන මාර්ගය වන බවත්, මෙම මාර්ගයේ ගමන් කිරීම කෙතරම් දුෂ්කර ද යත් මෙහි ගමන් කරන විට ගැබිනි මව්වරුන්ට දරුවන් එම ස්ථානයේ දීම ලැබෙන බවට ගම්වැසියන් දොස් නඟන බවත්, පසුගිය දිනක එම මාර්ගයේ ගමන් කරන අවස්ථාවේ දී තමන්වද බයිසිකලයෙන් වැටුණු බවත්, පසුගිය වර්ෂා කාලයේ දී එහි තාර තට්ටුව සම්පූර්ණයෙන්ම ගැලවී ගොස් ඇති බවත් මේ නිසා එම කොටස කොන්ක්‍රීට් දමා සකස් කිරීම සුදුසු බවට මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.2. හබුරුගල එකමුතු ප්‍රජා කමිටුව මඟින් මැයි මස පළමු සතියේ පැවැත්වීමට නියමිත සෞඛ්‍ය සායනය වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
හබුරුගල එකමුතු ප්‍රජා කමිටුව නැවත ප්‍රතිසංවිධානය කළ බවත්, එම අවස්ථාවේ දී එම කමිටුව මඟින් සමිතියේ මුදල්වලින් ආයුර්වේද සෞඛ්‍ය සායනයක් පැවැත්වීමට යෝජනා කළ බවත්, ඒ සඳහා සභාවේ

අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවත්, මේ සඳහා අවශ්‍ය ඖෂධ සභාවෙන් ලබා ගැනීමට අවශ්‍ය වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිනව සභා සම්මත විය.

5.5.3. පහත මාර්ග පෙරමුසු යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- I. හබුරුගල පියැද්ද පාරේ ආරම්භක ස්ථානය
- ii. හබුරුගල පොදු සුසාන භූමියට පිවිසෙන මාර්ගයේ ආරම්භක ස්ථානය
- iii. හබුරුගල පරුස්ස පාර
- iv. හබුරුගල සූරියගම භාෂිත මහතාගේ නිවස අසල සිට රවී මහතාගේ නිවස අතර දක්වා වූ කොටස

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.4. හබුරුගල සූරියගම ප්‍රදේශයට සතියකට එක් දිනක් කසල රැගෙන ඒමට කසල ට්‍රැක්ටරය යෙදවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මෙම ප්‍රදේශයේ ආරම්භක කොටසේ ජනතාව සිටින්නේ පර්චස් 6, 7 ක වැනි කුඩා බිම් කොටස්වල බැවින් එම ජනතාවට කසල බැහැර කිරීම සම්බන්ධ ගැටලු පවතින බවත්, එම ජනතාවගේ පහසුව සඳහා සතියට එක් දිනක් එම කසල එකතු කිරීමට කසල රථය යොදවා දෙන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

එම ප්‍රදේශයේ ජනතාව වරිපනම් බදු නොගෙවන බැවින් මෙය ඉටු කිරීමට නොහැකි බවත්, දැනට වරිපනම් ගෙවනු ලබන ප්‍රදේශවලින් එකතු කරනු ලබන කුණු බැහැර කරන ස්ථානය සම්බන්ධයෙනුත් බෙන්තර ජනතාවගෙන් විශාල දෝෂාරෝපණයක් පවතින බවත්, මෙලෙස එක් එක් මන්ත්‍රීවරයා විසින් වරිපනම් බදු නොගෙවන තම කොට්ඨාසයන්වල කුණු එකතු කර ගෙනෙන ලෙස කරන ඉල්ලීම් ඉටු කළොත් එම කුණු ද බෙන්තරට රැගෙන ආවොත් එම ප්‍රදේශයේ ජනතාව ඒ සම්බන්ධයෙන් දැඩි ලෙස විරුද්ධ වීමට ඉඩ ඇති බවත්, ඒ අනුව මුළු සභා බල ප්‍රදේශයටම වරිපනම් බදු පැනවීමට සිදු වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, එකඟතාවයක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත නොවී ය.

**5.6. <u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.6.1. මහගොඩ සිල්වර්ගාඩ්න් කොටසෙහි අඩක් වැඩ නිමවා ඇති ජල ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස නිමවා අවසන් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.2. මා විසින් පෙර යෝජනා කළ වැදිගවත්ත පළමු හරස් මඟ බෝක්කුව සහ බෝගහගොඩවත්ත පොදු ළිඳ කඩිනම් කර අවසන් කරන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.3. බෝගහගොඩවත්ත සුසාන භූමිය සභාවට පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර සිදු කරන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිණී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
මෙහි මැනුම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මේ වන විට සිදු කර තිබෙන බවත් එහි ඉතිරි වැඩ කටයුතු කඩිනම් කරන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.7. <u>ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.7.1. දීර්ඝ කාලයක සිට අබලන්ව පවතින ගලගම ග්‍රාම නිලධාරී වසමේ සම්පූර්ණ දුර ප්‍රමාණය මීටර් 75 ක් පමණ වන පේඩිගේවත්ත පාර සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ කොන්ක්‍රීට් අතුරා පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.7.2. ගමන් කිරීමට අපහසුව පවතින ගල්බඩ ග්‍රාම නිලධාරී වසමේ සම්පූර්ණ දුර මීටර් 25 ක් පමණ වන සරත් පයාගල හා සිරිසෝම යන මහත්වරුන්ගේ නිවෙස්වලට ගමන් කරන ගම්මැද්ද පාර කොන්ක්‍රීට් අතුරා පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.8. <u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.8.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වහළය මත සහ හබුරුගල උප කාර්යාලීය ගොඩනැගිල්ලේ වහළය මත විදුලි උත්පාදක සූර්ය පැනල පද්ධති ස්ථාපනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.2. ඇලකාක ග්‍රාම නිලධාරී වසමේ ඇලකාක නිල සෙවණ ගොඩනැගිල්ල සහිත මාර්ගයේ සිට තොටකනත්ත ග්‍රාම නිලධාරී වසමේ ප්‍රගති මාවතේ ආරම්භය දක්වා මාර්ගය දෙපස පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.3. තුන්දුව බටහිර පොදු සුසාන භූමිය පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.4. ඇතුන්ගාගොඩ ග්‍රාම නිලධාරී වසමේ ලේක්ව්ව් හී සභාව සතු භූමියේ පොදු ළමා උද්‍යානයක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.5. වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ නිල සෙවණ ගොඩනැගිල්ල සහිත භූමියේ නළ ළිඳක් සහ ඇලකාක ග්‍රාම නිලධාරී වසමේ බොරලුකැටිය ( ඇලකාක පොදු සුසාන භූමියට යාබදව) ප්‍රජා ජල ව්‍යාපෘතියක් හෝ නළ ළිඳක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.9. <u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>

5.9.1. ශ්‍රී සෝනුත්තර මාවත සහ කෝම්මල ආරච්චිමුල්ල පාර ප්‍රිමික්ස් යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
ආරච්චිමුල්ල කෝම්මල පාර මේ වන විට බයිසිකලයකින්වත් ගමන් කිරීමට නොහැකි තත්ත්වයට පත්ව ඇති බවත්, ජල සම්බන්ධතා ලබා දීම සඳහා පාරවල් කැඩීම නිසා මේ තත්ත්වය ඇති වී තිබෙන බවත්, මේ මාර්ගය නිසි පරිදි සකස් කිරීම සඳහා දින දෙකක් තුනක් පමණ ගතවන බවත්, මේ සඳහා සභාව මඟින් මුදල් අයකර ගැනීම් සිදු කර තිබෙන නිසා කඩිනමින් එම මාර්ගය මෙන්ම ශ්‍රී සෝනුත්තර මාවත ද ප්‍රිමික්ස් යොදා සකස් කිරීම සිදු කරන ලෙසටත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සභාව මඟින් මුදල් අයකර ගැනීම් සිදු කර තිබෙන නිසා එම කටයුතු කඩිනමින් සිදු කළ යුතු බවත්, මෙවැනි මාර්ග සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.10. <u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>

5.10.1. බල ප්‍රදේශයේ තරුණ ප්‍රජාව විෂ මත්ද්‍රව්‍යාවලින් ඈත් කොට ක්‍රීඩා සඳහා යොමු කිරීමේ අරමුණින් සෑම කොට්ඨාසයකම රාත්‍රී ක්‍රීඩා කළ හැකි වොලිබෝල් ක්‍රීඩා පිටි සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>

තරුණ ප්‍රජාව මේ වන විට විෂ මත්ද්‍රව්‍යයක් වන පෙති සඳහා යොමු වී ඇති බවත්, ක්‍රීඩා කටයුතුවලින් ඈත් වී ගොස් ඇති බවත්, විෂ මත්ද්‍රව්‍යවලින් තරුණයින් ඈත් කොට නැවත ක්‍රීඩා සඳහා යොමු කිරීමේ අරමුණින් සෑම කොට්ඨාසයකම නයිට් වොලිබොල් කෝඩ් එකක් සකස් කිරීමට යෝජනා කරන බවත්, ඒ සඳහා අවශ්‍ය නෙට්, බොල් ආදිය ලබා දීමට ද කටයුතු කරන ලෙසත්, ඒ සඳහා සභාවේ පොදු අනුමැතිය ලැබේ නම් එම කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ එම යෝජනාව කාලෝචිත වන බවත්, නයිට් වොලිබෝල් පමණක්ම නොව බැඩ්මින්ටන් එසේත් නැතිනම් ඇවිදින මං තීරු හෝ සකස් කිරීම සුදුසු වන බවත්, සෑම කොට්ඨාසයකම තරුණයින්ට එකතු වීමට පොදු ස්ථානයක් සකස් කිරීම සුදුසු වන බවත්, එසේ නොමැතිකමින් තැන්තැන්වල පිරිස් එකතු වීම මෙවැනි මත්ද්‍රව්‍යවලට යොමු වීමට හේතුවන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙය ඉතා සාර්ථක යෝජනාවක් වන බව මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.2. අංක 40 බී හිපන්වත්ත ග්‍රාම සේවා වසමේ මීට වසර 35 - 40 කට පෙර වැසීගිය දියපරදූව පාසලේ ක්‍රීඩා පිටිය ළමුන්ට ක්‍රීඩා කිරීමට හැකිවන ලෙස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>

මෙම වැසී ගොස් ඇති පාසලේ දුරාචාරයන් බහුලව සිදු වන බවත්, එහි පිට්ටනිය ළමුන් ක්‍රීඩා කිරීමට භාවිත කරන බවත්, එය සංවර්ධනය කර දීම සුදුසු බවත්, එමඟින් එම සථානයේ සිදුවන දුරාචාරයන් නැවැත්වීමට ද හැකියාව ලැබෙන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම යෝජනාව ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට සභාවේ යෝජනාවක් ලෙස යොමු කිරීම සුදුසුයි.

ඒ අනුව එම යෝජනාව ගරු සභාවේ යෝජනාවක් ලෙස ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට තීරණය කරන ලදී.

**5.11.** **<u>ගරු මන්ත්‍රී, සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.11.1. සභාව මඟින් ප්‍රතිසංස්කරණය කරන ලද අකාඩේගොඩ මැදගොඩ මාර්ගයේ අතරමැදි කොටසක ඇති අනතුරුදායක ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා</u>**
සභාව මඟින් ප්‍රතිසංස්කරණය කරන ලද අකාඩේගොඩ මැදගොඩ මාර්ගයේ මැද ඇති කොන්ක්‍රීට් කොටසේ අවදානම් ස්ථාන කීපයක් ඇති බවත්, බොහෝ දෙනා සිතා සිටින්නේ එම සම්පූර්ණ මාර්ගයම සභාව මඟින් ප්‍රතිසංකරණය කර ඇති බවත්, එම නිසා මේ ස්ථාන පිළිබඳ පැමිණිලි ලැබෙන බවත්, එම අවදානම් ස්ථාන කීපය ද සකස් කිරීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
එම කොටස අත හැර දැමීමට හේතුව තාර දැමීම එම ස්ථානයට ප්‍රායෝගික නොවන නිසා බවත්, ඉදිරියේ දී එම ස්ථානය ද සුදුසු අයුරින් සකස් කිරීමට කටයුතු කරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.2. අකාඩේගොඩ තුඩුපතවත්ත මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා</u>**
එම මාර්ගයේ මැද වෙල් කොටසක් ඇති බවත්, එම දෙපසට බැම්මක් දමා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම වඩා සාර්ථක වන බවත්, එම කොටස වර්ෂා කාලයේ දී මඳක් යටවන ස්ථානයක් වන බවත්, අකාඩේගොඩ සිට ගෝනගලට ගමන් කිරීමට තිබෙන ප්‍රධානම මාර්ගය වන බවත්, එහි කොටසක් හෝ කඩිනමින් සකස් කර දීමට හැකි නම් වඩා සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.3. අකාඩේගොඩ නාමල් රුවන් කුමාර මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා</u>
මෙම මාර්ගය වතු දෙකක් මැදින් යාමට තිබෙන ඉතා අබලන් තත්ත්වයේ පවතින මාර්ගයක් බවත්, නිවාස 06 කට පමණ ගමන් කිරීමට තිබෙන මාර්ගය වන බවත්, මෙහි මීටර් 75 ක පමණ කුඩා කොටසක් පමණක් ඇති බවත්, එම කොටස ප්‍රතිසංස්කරණය කර දීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.12. <u>ගරු මන්ත්‍රී, පූජ්‍ය ශ්‍රීලාල් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.12.1. කොටුවබැන්දහේන ග්‍රාමයට පිවිසෙන මාර්ගයෙහි ඇති අනාරක්ෂිත ඇළ මාර්ගය ඇති ස්ථානයට ආරක්ෂිත වැටක් ඉදිකර දෙන ලෙස මින් පෙර ඉදිරිපත් කර ඇති යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, පූජ්‍ය ශ්‍රලාල් මැතිතුමා</u>
කොටුවබැන්දහේන මාර්ගයේ අනාරක්ෂිත ස්ථානයක් සඳහා යකඩවලින් ආරක්ෂිත ස්ථානයක් ඉදි කිරීමට මින් පෙර යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, මෙම ස්ථානය තාක්ෂණ සේවා නිලධාරී මහතා විසින් පරීක්ෂා කිරීමට ගිය බවත්, එම ආරක්ෂිත වැට ඉක්මණින් ඉදි කර දීමට කටයුතු කරන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.10 ට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.10 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>තාක්ෂණ සේවා නිලධාරී ආර්. ජේ. එස්. මාදුවාගොඩ මහතා</u>
එම වැට ඉදි කිරීමට අවශ්‍ය කොටසේ තීන්ත ගා එම ස්ථානයට රැගෙන යා යුතු බවත්, දිග යකඩ බට බැවින් එම ස්ථානයට ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
ප්‍රවාහනය සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීමට කටයුතු කරන බව මෙහි දී සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.15 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.2. කොටුවබැන්දහේන ග්‍රාමයෙහි සිට ගල්පරේ මාර්ගයට පිවිසෙන අබලන් වී ඇති මාර්ගය JCB යන්ත්‍රයක් යොදා අලුත්වැඩියා කර දෙන ලෙස මීට පෙර ඉදිරිපත් කර ඇති යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, පූණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා</u>
මෙම යෝජනාවත් මීට පෙර ඉදිරිපත් කළ යෝජනාවක් වන බවත්, JCB යන්ත්‍රය මේ වන විට අලුත්වැඩියා කර අවසන් වන බැවින් මෙම මාර්ගය අලුත්වැඩියා කර දෙන ලෙස මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.13. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.13.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ මුදල් භාරකරු වෙත දැනට අනුමත කර ඇති සුළු මුදල් අග්‍රිමයේ අග්‍රිම සීමාව රු. 10,000/- ක් හා වරකට වියදම් කළ හැකි උපරිම මුදල රු. 1,000/- කි. වර්තමාන වෙළඳපොළ මිල මට්ටම අනුව එම මුදල් කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර, හදිසි නඩත්තු වැනි මිල දී ගැනීම් සඳහා කල්ගත වීම ද සිදු වේ. එබැවින් සුළු මුදල් අග්‍රිමය රු. 25,000/- දක්වා සහ වරකට වියදම් කළ හැකි මුදලේ සීමාව රු. 5,000/- ක් දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.2. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සේවක මණ්ඩලයේ සුභ සාධනය වෙනුවෙන් පිහිටුවා පවත්වාගෙන යන එකම සංගමය ප්‍රාදේශීය සභා සේවක සුභ සාධක සංගමය වේ. සභාවේ සියලු කාර්ය මණ්ඩලය එහි සාමාජිකත්වය දරනු ලබන අතර එම සංගමයේ වාර්ෂික චාරිකාව හා අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් සභා අරමුදලින් වාර්ෂිකව සභාව අනුමත කරනු ලබන මුදලක් පරිත්‍යාග කර ඇත. ඒ සඳහා වන නෛතික ප්‍රතිපාදන ප්‍රාදේශීය සභා පනතේ 132 (එ) වගන්තිය ප්‍රකාරව ඇතුළත්ව ඇත. මෙවර ද ඔවුන්ගේ අලුත්

අවුරුදු උත්සවය සහ වාර්ෂික චාරිකාව සඳහා සභා අරමුදලින් ආධාරයක් ලබා දෙන ලෙස මා වෙතින් ඉල්ලීම් කර ඇත. ඒ අනුව සලකා බෙන්තොට ප්‍රාදේශීය සභා සේවක සුභ සාධක සමිතියේ සාමාජික සාමාජිකාවන්ගේ හා ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ අලුත් අවුරුදු උත්සවය හා වාර්ෂික චාරිකාව වෙනුවෙන් සභා අරමුදලින් රු. 400,000/- ක මුදලක් ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.3. එළඹෙන වෙසක් පුන් පොහොය නිමිතිකොට ගෙන පවත්වනු ලබන ශ්‍රී සම්බුද්ධරාජ වෙසක් මංගල්‍යය - 2026 වැඩසටහන් මාලාව වෙනුවෙන් සකස් කරන ලද රු. 311,000/- ක දළ වියදම් ඇස්තමේන්තුගත මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.4. 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය අරමුණු කරගත් පුස්තකාල පාඨක ප්‍රවර්ධන හා රසවින්දන වැඩසටහන් මාලාව වෙනුවෙන් සකස් කරන ලද රු. 50,000/- ක දළ වියදම් ඇස්තමේන්තුගත මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.5. සභාවේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලදී විශේෂයෙන් ප්‍රිමික්ස් යොදා මාර්ග සංවර්ධනය කිරීමේ දී අඩු බර මාර්ග තලනයක අවශ්‍යතාවයක් පවතී. එබැවින් සභා අරමුදලින් ටොන් 01 ධාරිතාවයෙන් යුතු මාර්ග තලනයක් මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.6. සභාව මගින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා යොදා ගැනීමට 10 x 20 ප්‍රමාණයේ නව උත්සව මඩු 03 ක් සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.7. 2026 අප්‍රේල් මස 15 වන දින පැවැත්වීමට නියමිත බෙන්තොට ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීම සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය හේතුවෙන් සියලු දෙනාගේ පහසුව සඳහා අප්‍රේල් මාසය සඳහා පමණක් 2026 අප්‍රේල් මස 21 වන දින පෙ.ව. 9.30 ට පැවැත්වීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.8. ප්‍රාදේශීය සභා මාර්ගවල ජලනළ එළීමට සිදු කර ඇති කඩතොළු කිරීම් පිළිසකර කිරීම සහ ආරච්චිමුල්ල කෝම්මල ප්‍රධාන මාර්ගය සඳහා දැනට ඉල්ලුම්කර ඇති ප්‍රිමික්ස් කියුබ් 04 ක ප්‍රමාණයට අමතරව තවදුරටත් ප්‍රිමික්ස් කියුබ් 02 ක් සහ ප්‍රිමික්ස් ඇතිරීම සඳහා මාර්ග තලනයක් සහා අරමුදලින් කුළී පදනමින් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.14. <u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.14.1. කොබේදුව මහ කුරුන්ද සුරම්‍යගම අබලන් වට රවුම් පාර ඩෝසරය දමා පිළිසකර කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>
ඉතාම අපහසු මාර්ගයක් වන බවත්, යාමට අපහසුම බැවින් එම ගම්වාසීන් විසින් පොල්කොට හා ලී කැබලි දමා එම මාර්ගය සකස් කර ගෙන ඇති බවත්, සමහර නිවාසවල පිවිසුම කෙලින්ම පාරටම සාදාගෙන ඇති බවත්, මෙය ප්‍රතිසංස්කරණය කර දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.14.2. සූරියවිමන මැද පාරවල් ඩෝසරය දමා පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>
මෙම මාර්ගයත් මේ වන විට ඉතාම අබලන් බවත්, ගම්වාසීන් මේ නිසා වට රවුම් පාරක් භාවිත කරන බවත්, පැයක දෙකක පමණ කාලයකින් සකස් කළ හැකි කුඩා කොටසක් වන බැවින් එම මාර්ගය ද සකස් කර දීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.14.3. තපෝදාරාම පන්සල ප්‍රධාන මාර්ගය පෙරමුසු දමා පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-**

6.1. 2026.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2025.02.03 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.2. 2025.02.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.02.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.3. 2026.02.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.02.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

6.4. 2026.02.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.02.23 දින පැවති  මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-**

**7.1. 2026 පෙබරවාරි මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2026 පෙබරවාරි මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| 2026 පෙබරවාරි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 24,958,130.74 |
| එකතු කලා මූලධන ලැබීම් :- | - |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 24,958,130.74** |
| සේවක ණය | රු. 333,488.81 |
| තැන්පත් | රු. 3,696,387.52 |
| දේපළ ණය පොලී | රු. 16,250.09 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 57,500.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 3,375.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | රු. 58,899.00 |
| 101 ට බැර | රු. 93,462.00 |
| 201 ට බැර | රු. 145,495.08 |
| 301 ට බැර | රු. 101,033.42 |
| 601 ට බැර | රු. 32,717.02 |
| එකතුව | **රු. 29,496,738.68** |
| 2026 පෙබරවාරි මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 10,397,207.62 |
| එකතු කලා -ප්‍රාග්ධන වියදම් | රු. 3,120,139.18 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 13,517,346.80** |
| දේපළ ණය පොලී | රු. 11,052.14 |
| තැන්පත් | රු. 631,041.57 |

| | |
|---|---|
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 91,095.00 |
| ණය හිමියෝ | රු. 22,784,884.54 |
| එකතුව | **රු. 37,035,420.05** |

**7.2. 2026. 02.28 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2026.02.28 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරන පොදු ජංගම ගිණුම, අංක 81618288 දරන සේවක ණය ගිණුම, අංක 27 59057 දරන කර්මාන්ත ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

**7.3. 2026.02.28 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2026.02.28 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| ආදායම් ශීර්ෂය | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | රු. 6,181,069.45 |
| 2. අක්කර බදු | රු. 189,359.75 |
| 3. 1 % බදු | - |
| 4. කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. 11,250.00 |
| 8. වෙළඳ ස්ථාන කුළී | - |
| 10. වෙළඳ බලපත්‍ර ගාස්තු | - |
| 12.ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු | - |
| **එකතුව** | **රු. 6,381,679.20** |

**7.4. ගෙවීම් වවුචර් අනුමත කිරීම.**

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | | හබුරුගල සමුපකාර ග්‍රාමීය බැංකුවේ සරුකෙත ගොවි සංවිධානය ගි.අ. 1013019 - 6 | දෙද්දුව පන්සල පාරේ හරස් පාර මීටර් 100 ක් පිළිසකර කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 469,984.64 |
| 02 | | බෙන්තොට සමුපකාර ග්‍රාමීය බැංකුවේ දෝපේ උපස්ථායක වැඩිහිටි සමිතිය ගි.අ. 1025492 - 5 | බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලීය භූමියේ අමතර ප්‍රවේශය, ගේට්ටුව සහ වැට සැකසීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු.1,948,428.30 |

ඉහත ගෙවීම් වවුචර් ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය

**8. වෙනත් කරුණු**

**8.1. <u>ටෙන්ඩර් හා මිල ගණන්</u> :-** නැත

**8.2. <u>ඇස්තමේන්තු හා ගිවිසුම් සහාගත කිරීම</u> :-**

8.2.1. <u>ඇස්තමේන්තු අංක 01 :-</u>

ව්‍යාපෘතියේ නම :- හිපන්වත්ත නවදගල පරුස්සගොඩ පාර කොන්ක්‍රීට් කිරීම.

මුදල :- රු. 750,000.00

ඉහත ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**8.3. <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම :-</u>**

**<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>**
බෙන්තොටින් දකුණට පිවිසෙන ස්ථානයේ බෝධීන් වහන්සේ අභියස බඩ ඉරිඟු සහ තැඹිලි වැනි වෙළඳාම් කිරීමේ ස්ථානයක් තාවකාලිකව පවත්වාගෙන ගිය බවත්, මේ වන විට එහි ස්පීකර් දමා සිංදු දමා යම් යම් ඉදි කිරීම් සිදු කර එය එම ස්ථානයේ ස්ථාවර මට්ටමට රැගෙන යමින් පවතින බවත්, සභාපතිතුමාට මේ පිළිබඳ දැන්වූ විට පොලිස් ස්ථානය දැනුවත් කර ඇති බව පැවසූ බවත්, එය බෝධීන් වහන්සේ ඉදිරිපස සිදු කිරීම නුසුදුසු බවත්, පසුගිය පොහෝ දින බෝධියේ පිරිත් දමා ඇති අවස්ථාවේ ද එහි සිංදු දමා තිබූ බවත්, එම ප්‍රදේශයේ ජනතාව මේ පිළිබඳ දැඩි විරෝධතාවයක් දක්වන බවත්, සභාවෙන් මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු නොකරන්නේදැයි ඔවුන් විමසන බවත්, මේ සඳහා ස්ථිර විසඳුමක් ලබා ගත යුතු බවත්, මේ වන විට රේල් පාර අසලම මාළු ලැල්ලක් ද පවත්වාගෙන යන බවත්, එය ද බෝධීන් වහන්සේ අසලම සිදු කිරීම ඉතාමත්ම නුසුදුසු වන බවත්, ඔවුනට වෙළඳාම් කිරීම සඳහා ස්ථිර ස්ථානයක් ලබා දිය යුතු බවත්, බඩ ඉරිඟු වෙළඳාම එම ස්ථානයේ සිදු කිරීම නැවැත්වීමට සභාව අපොහොසත් වීම නිසා එම ස්ථානයේ මේ වන විට තවත් කුඩා වෙළඳාම් සිදු කරන පිරිස් විසින් වෙළඳාම් කිරීමට ආරම්භ කර ඇති බවත්, තම ජීවිකාව ගෙන යාම වෙනුවෙන් ඔවුන් මෙය සිදු කළත් එම ස්ථානය මේ සඳහා සුදුසු නොවන බවත්, ඒ වගේම පසුගිය දිනක බෙන්තර ප්‍රදේශයේ සෝලා ආලෝක පද්ධතියක් සවි කළ බවත්, බෙන්තර ප්‍රදේශයේ මෙය පළමුව සවි කිරීම පිළිබඳ ස්තූතිවන්ත වන බවත්, පෙර සවි කර තිබෙන කෝබ්‍රා ලයිට්වලට වඩා මෙහි ආලෝකය හොඳින් විහිදෙන බැවින් මෙය සාර්ථක ව්‍යාපෘතියක් වන බවත්, මෙලෙස බෙන්තර සංවර්ධනය කරා ගෙන යාම වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට තම ස්තූතිය පුද කර සිටින බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

බෝධීන් වහන්සේ ඉදිරිපිට සිදු කරනු ලබන වෙළඳාම පිළිබඳ පියවර ගැනීමට සභාවේ ඒකමතික තීරණයක් ලෙස පොලීසියටත් පිටපතක් ලැබෙන ලෙස ඒ අයට ලිපියක් යොමු කිරීමට කටයුතු කිරීම සුදුසු බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>

බෙන්තොට සංවර්ධනය කිරීමේ දී මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීමට කටයුතු කළ යුතු බවත්, ඒ සඳහා මන්ත්‍රීවරු සියලු දෙනා එකතු විය යුතු බවත්, තම ගම්වල මත්ද්‍රව්‍ය විකුණනු ලබන්නේ කවුරුන්ද කියා අපි අපිම හොඳන් දන්නා බැවින් නොබියව ඔවුන්ගේ තොරතුරු ලබා දීමට ඉදිරිපත් විය යුතු බවත්, ඒ වෙනුවෙන් සභාවක් ලෙස කටයුතු කළ යුතු බවත්, මේ සඳහා යම් බලපෑමක් කිරීමේ හැකියාවක් සභාවක් ලෙස පවතින බවත්, එසේ නොමැතිව ක්‍රීඩා පිටි කොතෙක් හැදුවත් වැඩක් නොමැති බවත්, ඒ වගේම බඩ ඉරිඟු වෙළඳාම් කරන පුද්ගලයා අහිංසක බවත්, තම ජීවිකාව ගෙනයාම පිණිස එම ස්ථානයේ වෙළඳාම් කළත් ඔහුගෙන් සමාජයට හානියක් නොමැති බැවින් ප්‍රථමයෙන් වැඩි අවධානයක් දිය යුතු වන්නේ මත්ද්‍රව්‍ය තුරන් කිරීමට වන බවත්, බෙන්තොට ගාමිණි විද්‍යාලීය නිවාසාන්තර ක්‍රීඩා උළලේ කටයුතු වෙනුවෙන් ලබා දුන් සහයෝගයට ගරු සභාපතිතුමා ඇතුළු සියලුම දෙනාට ස්තුතිවන්ත වන බවත් පවසමින් මෙහි දී අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

පසුගිය දිනක විෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් බෙන්තොට පොලීසියේ නිලධාරි මහතෙකු ගෙන්වා සභාවේ සියලුම කාර්ය මණ්ඩලය වෙනුවෙන් පැවැත්වූ බවත්, ඒ වගේම එහි දී එම නිලධාරියා වෙත පොලිස් ස්ථානාධිපතිතුමන්වත් දැනුවත් කොට ගම් මට්ටමින් මෙවැනි වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදන්නේ නම් ඒ සඳහා සභාවේ සහයෝගය ලබා දිය හැකි බවට යෝජනා කළ බවත්, ඒ අනුව හැකි අයුරින් දායකත්වය ලබා දීමට කටයුතු කරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තිලක් උපුල් චමින්ද මැතිතුමා</u>

පසුගිය 22 වෙනි දින සහෝදර විජිත් සම්පත් මැතිතුමාගේ මෑණියන් වියෝපත් වූ බවත්, මේ අවස්ථාවේ දී එතුමාට තම ශෝකය පළ කර සිටින බවත්, අවමංගල්‍ය කටයුතු සඳහා සහභාගී වූ සියලුම මන්ත්‍රීවරුන්ට ද ස්තුතිවන්ත වන බවත්, ඒ වගේම මෙවැනි අවස්ථාවක දී සභාව මඟින් ලබා දිය හැකි දේවල් පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙහි නිලධාරීන් හා සේවක පිරිස සඳහා සුභ සාධක සංගමයක් පවත්වාගෙන යනු ලබන බවත්, සභාවේ මන්ත්‍රීවරුන්ටත් එවැනි සමිතියක් පිහිටුවා ගැනීමේ හැකියාව පවතින බවත්, මින් පෙර සභා කාලවල දී ගාලු දිස්ත්‍රික්කයේ සභාපතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට සභාපති සංසදයක් හා මන්ත්‍රී සංසදයක් පවත්වාගෙන ගිය බවත්, නමුත් අලුත් සභිකයන් පත් වූ පසු එම සංසද පිහිටුවා නොමැති බවත්, අපේ ගරු මන්ත්‍රීවරයෙක්ගේ පුද්ගලික ජීවිතයේ බොහොම දුෂ්කර වූ අවස්ථාවක දී මන්ත්‍රී කණ්ඩායම ලෙස සහභාගී වී යම් දෙයක් රැගෙන යාමට හැකි නම් එය බොහෝ වටින බවත්, මෙම අවස්ථාවේ දී සභාපතිවරයා ලෙස සභාව මඟින් ලබා දිය හැකි ටෙන්ට්, පුටු ආදිය ලබා දුන් බවත්, ඒ වගේම ඕනෑම කෙනෙකුට අවශ්‍ය ඕනෑම වෙලාවක තමන් භාවිත කරනු ලබන කැබ් රථය ලබා දෙන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>

ගරු මන්ත්‍රී විජිත් සම්පත් මැතිතුමන් තම ඥාතීන් වන බවත්, එතුමාගේ මව පිළිකා රෝගය හේතුවෙන් මිය ගිය බවත්, ගරු සභාපතිතුමන් හා සම්බන්ධ වී එම අවස්ථාවේ දී සභාවෙන් පුටු 65 ක් හා කැනපි 03 ක් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කළ බවත්, ඒවා ලබා දීම පිළිබඳ ගරු සභාපතිතුමන්ට ස්තූතිවන්ත වන බවත්, අවමංගල්‍ය කටයුතු නිම වන තෙක් රැඳී සිටි ගරු සභාපතිතුමන්ට හා මන්ත්‍රීවරු සියලු දෙනාට ස්තූතිවන්ත වන බවත්, විජිත් සම්පත් මන්ත්‍රීතුමා අද දින සභාවේ සිටියා නම් මේ පිළිබඳ පූර්ණ කතාවක් සිදු කරන බවත්, මෙම අවස්ථාවේ දී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනා සහභාගී වී කටයුතු කළ බවත්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිශාන්ත පෙරේරා මහතා ද මෙම අවස්ථාවට සහභාගී වී සිටි බවත්, ඉදිරියේ දී මෙවැනි ශෝකජනක අවස්ථාවල දී ඕනෑම ආයතනයක සිදු කෙරෙන පරිදි ඒ අයට සහනයක් සලසා දෙමින් යම් උපකාරයක් සිදු කිරීමට අවශ්‍ය යම් සුභ සාධන වැඩපිළිවෙළක් සකසා ගැනීමට මෙහි දී ඌණ පූර්ණයක් එකතු කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>

මහගොඩ ප්‍රදේශයේ ගමන් කිරීමට ඉතාම අපහසු තත්ත්වයේ පැවති මාර්ග 02 ක් කොන්ක්‍රීට් කර සකස් කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිවන්ත වන බවත්, ඒ වගේම සිල්වර් ගාර්ඩ්න් ජල ව්‍යාපෘතිය සම්බන්ධවත් ස්තූතිවන්ත වන අතර එහි ඉතිරි වැඩ කටයුතු කඩිනමින් අවසන් කර ජනතාවට ලබා දීමට කටයුතු කරන ලෙසත්, ඒ වගේම මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද පාරවල් කොන්ක්‍රීට් කිරීම වැනි යෝජනාවලට අතර ඉදිරිපත් කරන ලද බෝක්කුවක් දැමීමක්, ළිඳක් සුද්ද කිරීමක්, කාණුවක් කැපීමක් වැනි කුඩා යෝජනා මාස 06 ක් ගතවී ඇතත් නොකෙරුණ ඒවා පවතින බවත්, ඒ හේතුවෙන් සභාවක් ලෙස මීට වඩා ක්‍රියාකාරීව වැඩ කිරීමට අවශ්‍ය බවත්, ඒ වගේම මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාළව වළල්ලාවිට ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දෙන ලෙස මතක් කිරීමක් සිදු කරන බවත්, ඒ වගේම එළඹෙන සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් සභාවේ සේවක සුභ සාධක සමිතියෙන් අලුත් අවුරුදු උත්සවයක් පැවැත්වීමට කටයුතු සංවිධානය වන බවට තොරතුරු ලැබුණු බවත්, සභාවේ මන්ත්‍රීවරුන් 23 දෙනාට මෙම මේසය වටා රැස් වී සිටීම හැර වෙනත් අවස්ථාවක දී මෙතෙක් සාමූහිකව එක් වී සමඟිය සහයෝගය සුහදත්වය වර්ධනය කර ගැනීමට අවස්ථාවක් නොලැබුණු බැවින් මෙම පවත්වනු ලබන අවුරුදු උත්සවය සඳහා මන්ත්‍රී මණ්ඩලය ද සහභාගී කරවා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

පසුගිය දිනවල විදුලි බල්බ සම්බන්ධව යම් යම් ගැටලු පැවතුණත් මේ වන විට ඒවා නිරාකරණය වී ඇති බවත්, ඉදිරියේ දී තව දුරටත් එම කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

### 8.4. <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම :-</u>

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් අද දින සභාවට නොපැමිණි පහත මන්ත්‍රීවරුන් ඉදිරිපත් කර ඇති නිවාඩු ඉල්ලීම් ලිපි ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

01. ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය
02. ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය
03. ගරු මන්ත්‍රී එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය

ඉහත මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී සමිත පුංචිහේවා මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-</u>**

අද දින ඉතා සතුටින් සභාවේ වැඩකටයුතු මෙහෙයවූ බවට විශ්වාස කරන බවත්, මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 18 දෙනාට ස්තුතිවන්ත වන බවත් පවසමින් ගරු සභාපතිතුමා විසින් සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

පෙ.ව. 11.50 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

............................

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,

සභාපති,

බෙන්තොට ප්‍රාදේශීය සභාව.